වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
රබර් පර්යේෂණ මණ්ඩලය
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය

පුරප්පාඩු

ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

අ. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගිණුම්කරණ/ වාණිජ්‍යය උපාධිය

සමග

ගිණුම්කරණ/ වාණිජ්‍යය පශ්චාත් (විද්‍යාපති) උපාධිය

සහ

අවම වශයෙන් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර දෙළහක (12) සේවා පළපුරුද්ද.

හෝ

ආ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ICASL) හෝ වරලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය (CIMA) හෝ සහතිකලත් ආශ්‍රිත ගණකාධිකාරීන්ගේ සංගමය (ACCA) හෝ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීන්ගේ සංගමය (APFA) මගින් ලබාගත් පූර්ණ සාමාජිකත්වය

සහ

අවම වශයෙන් සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර දෙළහක (12) සේවා පළපුරුද්ද.

ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරී තනතුරට අදාල වයස වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :

අවුරුදු 35 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 55 ට වඩා අඩු විය යුතුය.

HM 1-2 (රු.39,255 - 15x1,100 - 55,755/-)

සටහන : මෙම තනතුරට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු උපදෙස් වලට අනුකූලව ප්‍රවාහන හා ඉන්ධන දීමනාව ගෙවනු ලැබේ.

2. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන්

3. ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරීන්

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

අ. අදාල විෂය සංකලනය සහිත, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ ඉහළ, සිව් (04) වාර්ෂික විද්‍යාවේදී හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය

හෝ

ආ. අදාල විෂය සංකලනය සහිත, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්, දෙවැනි පෙළ පහළ, සිව් වාර්ෂික (04) විද්‍යාවේදී හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය සමග අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය

හෝ

ඇ. අදාල විෂය සංකලනය සහිත විද්‍යාවේදී හෝ කෘෂිකර්ම උපාධිය සමග අදාල ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක (02) පර්යේෂණ පශ්චාත් උපාධිය

සහ

අදාල ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය සමග පළමුවැනි උපාධිය ලබා ගැනීමෙන් පසු වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද.

සටහන :

ක්ෂේත්‍රයට අදාල ප්‍රකාශන ඉදිරිපත් කිරීම අමතර සුදුසුකමක් වනු ඇත.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරී හා ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී තනතුරු සඳහා වයස වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :

අවුරුදු 30 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට වඩා අඩු විය යුතුය.

AR - 2 - (Rs. 34,550 - 10x925 - Rs. 43,800)

4. ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලන හෝ කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

සහ

එම උපාධිය ලබා ගැනීමෙන් පසු අදාල විෂයය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම.

5. නේවාසික ඉංජිනේරු

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

පිළිගත් විශ්ව විද්‍යාලයකින් සිවිල් ඉංජිනේරු උපාධිය ලබා ගැනීමෙන් පසු අදාල ක්ෂේත්‍රය සම්බන්ධව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික සීමිත සමාගමක වසර තුනක (03) සේවා පළපුරුද්ද.

හෝ

ජාතික තාක්ෂණ ඩිප්ලෝමා (NDT) (සිවිල්) හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) සමග සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධව රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික සීමිත සමාගමක වසර අටක (08) සේවා පළපුරුද්ද.

කොන්දේසි :

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය, අගලවත්ත පරිශ්‍රයෙන් ගෘහභාණ්ඩ සමග කුලී රහිත නිල නිවසක් සපයන අතර, එහි පදිංචිව සිටීම අනිවාර්ය වේ.

ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී හා නේවාසික ඉංජිනේරු තනතුරු සඳහා අදාල වයස, වැටුප් කාණ්ඩය සහ වැටුප් පරිමාණය

අවුරුදු 22 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට වඩා අඩු විය යුතුය.

MM 1-2 (රු. 25,605-10x645-15x925 - 45,930/-)

6. පර්යේෂණ නිලධාරීන්

(ශස්‍ය විද්‍යාව, රසායන විද්‍යාව, පාංශු විද්‍යාව, ශාක ව්‍යාධි විද්‍යාව, උද්භිද විද්‍යාව, ප්‍රවේණි විද්‍යා හෝ සංඛ්‍යාත විශේෂ උපාධිය ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි විශේෂ අවධානය යොමු වනු ඇත.)

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

අ. අදාල විෂය සංකලනය සහිත, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, පළමුවැනි පෙළ හෝ දෙවැනි පෙළ ඉහළ, සිව් (04) වාර්ෂික විද්‍යාවේදී හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය

හෝ

ආ. අදාල විෂය සංකලනය සහිත, පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත්, දෙවැනි පෙළ පහළ, සිව් (04) වාර්ෂික විද්‍යාවේදී හෝ කෘෂිකර්ම විශේෂ උපාධිය සමග අවම වශයෙන් අදාල ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය

හෝ

ඇ. අදාල විෂය සංකලනය සහිත විද්‍යාවේදී හෝ කෘෂිකර්ම උපාධිය සමග අදාල ක්ෂේත්‍රයේ අවුරුදු දෙකක (02) පර්යේෂණ පශ්චාත් උපාධිය.

පර්යේෂණ නිලධාරී තනතුරු සඳහා අදාළ වයස, වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය :

අවුරුදු 22 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට වඩා අඩු විය යුතුය.

AR-1 (රු. 24,725 - 5x550 - 5x645 - 15x770 - රු. 42,250/-)

7. ගිණුම් සහ ප්‍රසම්පාදන නිලධාරී

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ හෝ වාණිජ්‍යය උපාධිය හෝ ගිණුම්කරණ උසස් ජාතික ඩිප්ලෝමාව (HNDA)

සහ

සැපයුම් හා භාණ්ඩ කළමනාකරණය පිළිබඳව එක් අවුරුදු සහතික පත්‍ර පාඨමාලාවකින් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික සීමිත සමාගමක (PLC) දේශීය හා විදේශීය සැපයුම් කටයුතු සම්බන්ධව විධායක තනතුරක වසරක (01) සේවා පළපුරුද්ද.

8. ඉංජිනේරු සහකාර

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

ජාතික තාක්ෂණ (සිවිල්) ඩිප්ලෝමාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාව

සහ

අදාළ ඩිප්ලෝමාවෙන් පසු ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ අවම වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් පුද්ගලික සීමිත සමාගමක වසර හයක (06) පළපුරුද්ද

සටහන :

යාන්ත්‍රික (මෝටර් රථ) හා විදුලිබල තඩන්තු කටයුතු සම්බන්ධ දැනුම අමතර සුදුසුකමක් වනු ඇත.

ගිණුම් සහ ප්‍රසම්පාදන නිලධාරී හා ඉංජිනේරු සහකාර තනතුරු සඳහා අදාල වයස, වැටුප් කාණ්ඩය සහ වැටුප් පරිමාණය

අවුරුදු 22 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට වඩා අඩු විය යුතුය.

JM 1-2 (රු. 20,890 - 10x365 - 18x550 - 34,440/-)

9. කර්මාන්තශාලා නිලධාරී

බාහිර අයදුම්කරුවන් සඳහා

සුදුසුකම් :

එක් වතාවකදී අ.පො.ස (උ.පෙ.) විෂයයන් තුනක් (03) සමත්වීම සහ එක් වතාවකදී, ගණිතය සහ භාෂාව (සිංහල/ දෙමළ) ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සහිතව අ.පො.ස (සා.පෙ.) විෂයයන් හයක් (06) සමත්වීම සහ

රජයේ හෝ පිළිගත් පුද්ගලික වතුයායක රබර් කර්මාන්තශාලාවක දළ රබර් සැකසීම සම්බන්ධව වසර දෙකක (02) පළපුරුද්ද

සමග

ජාතික වෘත්තීය කුසලතාවන් හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු වසර දෙකක (02) රබර් රසායනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ රබර් තාක්ෂණය පිළිබඳ ඒ සමාන පාඨමාලාවක් හදාරා තිබීම.

කර්මාන්ත ශාලා නිලධාරී සඳහා අදාල වයස වැටුප් කාණ්ඩය හා වැටුප් පරිමාණය

අවුරුදු 18 ට වඩා වැඩි විය යුතු අතර, අවුරුදු 45 ට වඩා අඩු විය යුතුය.

MA 2-2 (රු. 14,610 - 10x145 - 7x170 - 4x290 - 20x345 - රු. 25,310/-)

තේරීමේ ක්‍රමය :

අංක 1, 7 සහ 8 තනතුරු සඳහා :

පත්වීම් අධිකාරිය විසින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයකින් හෝ/ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

අංක 2, 3, 4 සහ 5 තනතුරු සඳහා :

පත්වීම් අධිකාරිය විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

අංක 6 තනතුර සඳහා :

පත්වීම් අධිකාරිය විසින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයකින් (යෝග්‍යතා) හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

අංක 9 තනතුර සඳහා :

පත්වීම් අධිකාරිය මගින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයේ (භාෂා නිපුණත්වය/ ප්‍රවීණතාවය, යෝග්‍යතා පරීක්ෂණය සහ තනතුරට අදාළ විෂයය දැනුම) ප්‍රතිඵල වලට අනුව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

වෙනත් වරප්‍රසාද :

- ආයතනයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයේ පවතින නීති රීති ප්‍රකාර වෛද්‍ය ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ.
- සේවකයා විසින් වැටුපෙන් 10% ක් කාර්ය මණ්ඩල අර්ථ සාධක අරමුදල සඳහා දායක කළ යුතු අතර, ආයතනය විසින් 15% දායකත්වයක් සපයනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල වෙනුවෙන් ආයතනය විසින් 3% දායකත්වයක් සපයනු ලැබේ.
- ඉහත දක්වා ඇති වැටුපට අමතරව රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ඇතුළු අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.
- අගලවත්ත ප්‍රධාන කාර්යාලයේ සේවය සඳහා තේරී පත්වන අය සඳහා (ආයතන නීති රීති ප්‍රකාර) ගිස්ව නිවෙස් නම්, කුලී රහිත, ගෘහ භාණ්ඩ සහිත නිල නිවසක් ලබා ගැනීමට හෝ රත්මලාන සිට අගලවත්ත දක්වා ධාවනය කෙරෙන කාර්යාල බස් රථයෙන් දින පතා ගමන් කිරීමේ පහසුකම් ලබා ගත හැක.

අයදුම්පත් :

පහත දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව සකසන ලද අයදුම්පත් 2016 ජනවාරි 26 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය. ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කළ යුතු අතර, දැනට රාජ්‍ය සේවයේ/ සංස්ථා/ මණ්ඩල/ පුද්ගලික ආයතනවල සේවය කරන අයදුම්කරුවන් තමන්ගේ අයදුම්පත අදාළ ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. එයට අමතරව අයදුම්පතේ පිටපතක් කෙලින්ම ඉදිරිපත් කළ හැක.

1. සම්පූර්ණ නම, වයස හා විවාහක අවිවාහක බව
2. **අදාළ අධ්‍යාපන සහතික සහ වෙනත් සහතික වල සහතික කරන ලද පිටපත් ඇමිණීම අනිවාර්ය වේ.**
3. වර්තමාන සහ පසුගිය රැකියාවන් හි රැකියා යෝජකයන් ගේ නම, ලිපිනය සහ රැකියාව වෙනස් කිරීමට හේතු
4. අයදුම්කරුගේ කුසලතාවයන් සහ දැනුම ඇගයිය හැකි ගුණීන් නොවන නිර්දේශකරුවන් දෙදෙනෙකු ගේ නම සහ ලිපිනයන්.

ඉහත අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුකාරක වේ. කුමන ආකාරයකින් හෝ මේ සම්බන්ධයෙන් අතිසි බලපෑම් කිරීම ද නුසුදුසුකමක් වනු ඇත.

අධ්‍යක්ෂ,
ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය,
ඩාර්ටන්ෆීල්ඩ්, අගලවත්ත.

2016-01-04